සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 09 - 2023**

## නාට්‍ය හා රංගකලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරෙන් 1 සිට 4 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - "තව පොඩ්ඩකින් මම බොහෝම වැදගත් දෙයක් කියනවා. කව්ද මේ ජනේලය වැහුවේ."

B - "යස ඉසුරු පිරුණු තැනා
සිරි දෙව්දු සිටින තැනා..."

C - "ඉතිං සැනසෙන්න
හොඳින් පුළුවන්නේ"

D - "ස්වාමීනී නුඹ කවර නම් වීද"

01) නව නාට්‍ය ගීතයක් හා සම්බන්ධ වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

02) නාට්‍යධර්මී නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

03) බෞද්ධ පූජාකර්ම හා සම්බන්ධ වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

04) හෙන්රි ජයසේනයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයකට අයත් සංවාද කණ්ඩයක් වන්නේ,
1. A 2. B 3. C 4. D

- පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05) නාට්‍ය කලාව,
1. ඒක පුද්ගල කලාවකි. 2. ද්වි පුද්ගල කලාවකි.
3. සාමූහික කලාවකි. 4. මින් එකක්වත් අදාළ නොවේ.

06) නාට්‍ය තුළ එකිනෙකට ප්‍රතිවිරුද්ධ අදහස් එකිනෙකට මුණගැසීම මත ඇති වන්නේ,
1. චරිත . 2. සංවාද.
3. ගැටුම. 4. කුතුහලය.

07) කිසියම් කලාකෘතියක් ඉදිරිපත්කරන විලාශය හඳුන්වන්නේ,

1. අනුකරණය ලෙසයි. 2. ශෛලිය ලෙසයි.
3. සංවාද ලෙසයි. 4. ගැටුම ලෙසයි.

08) නාට්‍යයක වේෂභූෂණය යනු,

1. පසුතල නිර්මාණ. 2. රංගාලෝකය.
3. අංගරචනය. 4. ඇඳුම් පැළඳුම්.

09) දෑස් අතර මනා සබඳතාවක් ඇතිකිරීම සඳහා සිදුකළ හැකි රංග අභ්‍යාසයකි,

1. ශ්වසන අභ්‍යාස. 2. දර්පණතල අභ්‍යාස.
3. තාපන අභ්‍යාස. 4. හඬ අභ්‍යාස.

10) ශිථිල කරණ යනු,

1. මනස සැහැල්ලු කිරීම. 2. සිරුරේ අංගප්‍රත්‍යාංග සිසිල් කිරීම.
3. සිරුර නිරෝගිමත් කිරීම. 4. සිරුර හැඩ ගැන්වීම.

- පහත දැක්වෙන ජායාරූප ඇසුරින් 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D E

11) නාට්‍ය ධර්මී ශෛලිය ලාංකීය නාට්‍ය කලාවට ප්‍රථමයෙන් හඳුන්වා දෙන ලද්දේ,

1. A ය. 2. B ය. 3. D ය. 4. E ය.

12) ළමා නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ,

1. A ය. 2. C ය. 3. D ය. 4. E ය.

13) ඉහත ජායාරූප අතර අංගාරාගඟ ගලාබසී, සහ මෝදර මෝල නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1. B ය. 2. C ය. 3. D ය. 4. E ය.

14) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයේ ආරම්භයේ සිටම සුප්පා දේවියගේ චරිතය රඟපාන ලද්දේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

15) කැරකෙන වේදිකාව මෙරටට හඳුන්වා දුන් නාට්‍යකරු වන්නේ,

1. A ය. 2. C ය. 3. D ය. 4. E ය.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා පහත සඳහන් ගොනු අතුරින් නිවැරදි **පිළිතුරු** තෝරා හිස්තැනහි ලියන්න.

| | | |
|---|---|---|
| නාගසේන හිමියන් | නම්පොත | හැංගිහොරා |
| මකර වලිගය | බුද්ධ ගජ්ජය | යතුර හැංගීම |
| මගුල් ප්‍රස්තාව | ශිථිල කරණ | දේව දූතයා |
| තල්පත | චෙරිවත්ත | වළහැඩියා |
| සකස්කඩය | කැලණිපාලම | බල්ලා හා මස්කට්ට |
| තලමල පිපිලා | විකෘති | මනමේ |

16) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අනුවර්තන නාට්‍ය වන්නේ,

....................................... ........................................... .......................................

17) බෞද්ධ පූජාකර්ම හා සම්බන්ධ වන්නේ,

....................................... ........................................... .......................................

18) රංග ක්‍රීඩා හා සම්බන්ධ වන්නේ,

....................................... ........................................... .......................................

19) හඬ අභ්‍යාස සඳහා වැදගත් වන්නේ,

....................................... ........................................... .......................................

20) ලෝකධර්මී නාට්‍ය වන්නේ,

....................................... ........................................... .......................................

(ල. 1 - 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

01) "(දුක්මුසු ස්වරයෙන්) අපේ මැණියෝ නැතිවෙලා කොච්චර කල්ද? මට කිසිකෙනෙක් නෑ ඉන්නෙ අර මහළු අත්තම්මා විතරයි. උන්දැගාව මස්සක්වත් නෑ...."

i. ඉහත සංවාද කණ්ඩය අයත් නාට්‍යයේ නිර්මාණකරු හා එම නාට්‍යයට මූලික වූ ජාතක කතාව නම් කරන්න.
ii. ඉහත සංවාදයේ එන රංගවිධානයක් ලියා දක්වන්න.
iii. එම සංවාදය කියන චරිතය කුමක්ද?
iv. මෙම නාට්‍ය පළමුවරට රඟදැක්වූයේ කිනම් වර්ෂයේද?
v. "අතට වළලුද පයට ගිගිරිද" යන ගීතය සම්පූර්ණ කරන්න. (ල. 2 x 10)

02) i. සමාරෝපය යනු කුමක්ද? (ල. 02)
ii. සමාරෝපයට දායකවන ප්‍රබල අනුෂාංගික කලා දෙකක් නම් කරන්න. (ල. 04)
iii. සමාරෝපයට නළුකාර්යට වැදගත්ද? ඔබේ අදහස් දක්වන්න. (ල. 04)

03) i. ඔබ ඉගෙනගත් රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා දෙක බැගින් ලියාදක්වන්න. (ල. 02)

ii. රංග ක්‍රීඩාවල යෙදීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 04)

iii. ඔබ පන්තිකාමරයේ දී කරන ලද රංග අභ්‍යාසයක් හෝ රංගක්‍රීඩාවක් සිදුකළ ආකාරය විස්තර කරන්න. (ල. 04)

04) i. නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

ii. එම නාට්‍යකරුවන්ගේ නිර්මාණ දෙක බැගින් ලියා දක්වන්න. (ල. 02)

iii. ඉන් ඔබ කැමති නාට්‍ය කරුවෙකුගේ සේවය ඇගයීමක් කරන්න. (ල. 06)

05) පියුමිගේ අම්මාට හොඳටම අසනීප වීම නිසා පියුමි බොහෝවෙලාවට උදේ පාසලට ගියේ කුසගින්නේ ය. එදින සඳුදා දිනයක් විය. උදෑසන රැස්වීමේ දී පියුමි......

i. පසුබිම, කාලය, චරිත, රංගවිධාන සංවාද සහිත පෙළ රචනය. (ල. 03)

ii. ගැටුම් අවස්ථා පරිකල්පනය සහිතව පෙළ රචනය. (ල. 03)

iii. කතාවස්තුව නාට්‍යෝචිත අවස්ථා සහිතව පෙළ රචනය. (ල. 04)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# නාට්‍ය හා රංගකලාව - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

## I කොටස

| | | |
|---|---|---|
| 1 - 2 | 6 - 3 | 11 - 2 |
| 2 - 3 | 7 - 2 | 12 - 1 |
| 3 - 4 | 8 - 4 | 13 - 4 |
| 4 - 1 | 9 - 2 | 14 - 4 |
| 5 - 3 | 10 - 1 | 15 - 2 |

16 - මඟුල් ප්‍රස්ථාව / හැංගිහොරා / වළහැඩියා.

17 - නාගසේන හිමියන් / තල්පත / දේවදූතයා.

18 - මකර වලිගය / බල්ලා සහ මස්කට්ට / යතුරු හැංගීම.

19 - සකස්කඩය / බුද්ධ ගජ්ජය / නම්පොත.

20 - තලමල පිපිලා / විකෘති / කැළණි පාලම.

★ ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දෙකක්වත් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ල. 1 x 20 )

## II කොටස

01) i. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා. - සේරිවානිජ ජාතකය.

ii. "දුක් මුසු ස්වරයෙන්"

iii. සිටුදුව

iv. 1958 - 09 - 06 බොරැල්ල කරුණාබෞද්ධ සමිතිය.

v. " අතට වළලුද පයට ගිගිරිද ලා ගනි
කිඳුරගන සොබනා
වනේ සිදඹුවො කඩා මල්පෙති
වරල සරසා ගනිති නිතිනා
සඳුන් කුංකුම ගතේ තවරා සුවඳ වේ අභිසාරිකා
පියවි සුන්දර රූසපුව වුව ලකළ වේලු සඳ පලදනා...."

★ මුල්පද හතර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02) i. නළුවා හෝ නිළිය තම පෞද්ගලික ස්වරූපය අමතක කොට වෙනත් පුද්ගල ස්වභාවයකට ආරූඪ වීම, ආවේශ වීම, වෙස්වලා ගැනීම.

★ අභිනය භාවිත කරමින් චරිතයකට ආරෝපණය වීම.

ii. අංග රචනය හා වේෂ භූෂණය

iii. සිසුවා ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

03) i.

| **රංග අභ්‍යාස** | **රංග ක්‍රීඩා** |
|---|---|
| ශිථිල කරණ අභ්‍යාස | යකෙක් ගමට ඇවිදින් |
| තාපන අභ්‍යාස | මකර වලිගය |
| ශ්වසන අභ්‍යාස | යතුරු හැංගීම |
| දර්පණතල අභ්‍යාස | බල්ලා හා මස්කට්ට |

★ ආදී ලෙස සිසුන් දක්වා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

ii. සාමූහික බව.

ක්ෂණික තීරණ ගැනීම.

නායකත්වයට ගරු කිරීම.

ඇහුන්කම් දීම. ආදී ලෙස.

iii. සිසුන් ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න.

04) i. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා. ගුණසේන ගලප්පත්ති මහතා.

දයානන්ද ගුණවර්ධන මහතා. සෝමලතා සුබසිංහ මහත්මිය.

රංජිත් ධර්මකීර්ති මහතා.

ii. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා.

| | |
|---|---|
| මනමේ | එලොව ගිහින් මෙලොව ආවා |
| කදාවළලු | රත්තරන් |
| සිංහබාහු | |

දයානන්ද ගුණවර්ධන මහතා.

| | | | |
|---|---|---|---|
| නරිබෑනා | ජසලෙන්විනා | ආනන්ද ජවනිකා | ඇමතිපට්ටම |
| බක්මහ අකුණ | ගජමන් පුවත | ස්වර්ණතිලකා | පිංගුත්තර |
| ජීවන වංචාව | මධුර ජවනිකා | පරාස්සයා | |

රංජිත් ධර්මකීර්ති මහතා.

| | | |
|---|---|---|
| හිරුනැතිලොව | අංගාරාගඟ ගලාබසී | චෙරි උයන |
| මෝදරමෝල | ආඬිරෑලේ නාඩගම | |
| මේස | හස්තිරාජ මහත්තය | |

ගුණසේන ගලප්පත්ති මහතා.

| | | |
|---|---|---|
| සඳකිඳුරු | දෑස නිසා | මාහේනේ ඊරියකා (ගුරු අත්පොත) |
| මුහුදු පුත්තු | ලියතඹරා | |
| දේවතාඑළි | තාත්තා | |

iii. ගුරු අත්පොත පරිශීලනය කරන්න.

05) සිසුන් ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබාදෙන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## නාට්‍ය හා රංගකලාව – ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකයඃ

01)
- i. ලෝකධර්මී සංවාද ඛණ්ඩයක් ඉදිරිපත් කිරීම. (ල.10)
- ii. නාට්‍ය ධර්මී සංවාද ඛණ්ඩයක් ඉදිරිපත් කිරීම. (ල.10)

(සිසුන් ඉදිරිපත්කරන සංවාද ඛණ්ඩය අනුව සංවාද ඛණ්ඩය ලබා දෙන්න.)

02) නාට්‍ය ගීත ගායනය රංගනය සමඟ. (ල.10)

03) කතන්දරයක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම. (ල. 10)

04) පහත සඳහන් එසැණ නිරූපණ මාතෘකා සිසුන්ට ලබා දෙන්න.
(ගුරුවරයාට අභිමත පරිදි වෙනස් කළ හැක.)

- i. නිවසේ තනියම හොල්මන් චිත්‍රපටියක් බලමින් සිටියදී විදුලිය විසන්ධි වේ.
- ii. සුපිරි වෙළඳසැලකින් බඩු අරගෙන බිල ගෙවන්න බලද්දි පර්ස් එක නැතිවෙලා.
- iii. රට ඉඳල අම්මා ගෙදර එන දවස.
- iv. පාන්දර ඔබේ නිවස ළඟට ගමේ සෙනග රැස්වී.
- v. පාරේ ගමන් කරද්දී විශ්‍රාමික විදුහල්පතිතුමා මුණගැසේ. (ල. 10)

(මුළු ලකුණු : 50)

(8) WWW.PastPapers.WiKi (7)



Download Term Test Papers, Short Notes From One Place!

(8) WWW.PastPapers.WiKi (8)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න